## මාධ්‍ය නිවේදනය

## <u>බෞද්ධ දහම් පාසල් අවසාන සහතිකපත්‍ර විභාගය - 2024 (2025)</u>

## <u>උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා අයදුම්පත් කැඳවීම</u>

උක්ත විභාගයේ උත්තරපත්‍ර ඇගයීම් කටයුතු සඳහා, මාර්ගගත ක්‍රමයට අයදුම්පත් කැඳවනු ලැබේ.

මේ සඳහා පහත උපදෙස් කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

1. අයදුම්පත් කැඳවීම මාර්ගගත ක්‍රමයට පමණක් සිදු කරනු ලබන අතර 2025.04.21 දින ප.ව. 4.00 සිට 2025.05.06 වන දින මධ්‍යම රාත්‍රී 12.00 තෙක් www.doenets.lk වෙබ් අඩවිය මඟින් හෝ www.onlineexams.gov.lk/eic වෙබ් ලිපිනය මඟින් හෝ අයදුම්පත් යොමු කරන ලෙස උපදෙස් ලබා දිය යුතුය.
2. මාර්ගගත ක්‍රමයට සම්පූර්ණ කර බාගත (Download) කරන ලද අයදුම්පතේ No. 13 යටතේ ඇති කොටස දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා විසින් සහතික කල යුතු අතර, අදාළ ගුරුවරයාගේ දහම් පාසල් කාල සටහනේ සහතික කරන ලද පිටපතක් අමුණා තිබිය යුතුය.
3. අයදුම්පතේ Step 03: (Details of the Degree), Step 04 : Under Professional Qualifications (Experience in Evaluation Activities) යන කොටස් වලට අදාළව නිවැරදි තොරතුරු ලබා දිය යුතු බවට විශේෂයෙන් උපදෙස් ලබා දිය යුතුය. ***උපාධි සහතිකය ඉදිරිපත් කිරීමේදී එක් එක් විෂයය හා ශ්‍රේණිය සහිත විස්තරාත්මක ලේඛනය ඉදිරිපත් කළ යුතුය.**

<u>ඉතා වැදගත්</u>

4. බාගත (Download) කරන ලද අයදුම්පතේ No. 14 යටතේ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ යුතු කොටස නිවැරදිව සම්පූර්ණ කර <u>සහතික කරන ලද ඇමුණුම් සියල්ල අයදුම්පත සමඟ විභාග දෙපාර්තමේන්තුව</u> වෙත එවිය යුතුය.
5. www.donets.lk වෙබ් අඩවියට පිවිස එහි ලබා දී ඇති **"Buddhist Dhamma Schools -Final Certificate Examination - 2024 (2025) Application for Marking Examiners"** යටතේ ඇති අයදුම්පත **Online** මඟින් සම්පූර්ණ කර **Submit** කරන්න. එවිට ලැබෙන **PDF** අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසියක **දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් මුද්‍රණය කර**, නවක පරීක්ෂකවරයකු නම් අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ සහතික පත්‍රවල සහතික කරන ලද පිටපත් ද අමුණා ඔබ විසින් එය අත්සන් කර ලියාපදිංචි තැපැලෙන් පහත ලිපිනයට එවන්න. සියලු තොරතුරු මාර්ගගත අයදුම්පතේ ඇතුළත් කර **Latest Updated Application** අප වෙත යොමු කරන්න.

**විභාග කොමසාරිස් ජනරාල්,**
**ආයතනික විභාග ඇගයීම් ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**තැ.පෙ. 1503,**
**කොළඹ.**

06. මේ සම්බන්ධයෙන් යම් විමසීමක් වේ නම් පහත සඳහන් දුරකථන අංක භාවිත කළ හැකිය.

| | |
|---|---|
| ආයතනික විභාග ඇගයීම් ශාඛාව | 011-2785105 / 011-2786235 |

**එච්.ජේ.එම්.සී. අමිත් ජයසුන්දර**
විභාග කොමසාරිස් ජනරාල්

tamilguru.lk